**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ**
**නීති නිලධාරී III වන පන්තියේ තනතුරට බඳවා ගැනීම - 2013**

මධ්‍යම පළාත් සභාවේ පුරප්පාඩුව පවත්නා නීති නිලධාරී තනතුරු සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා ආදර්ශ ආකෘතිය අනුව ඔබ විසින් පිළියෙල කරනු ලබන අයදුම්පත් **2013-12-13** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, තැ.පෙ. 114, කටුගස්තොට පාර, මහනුවර"**. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2013"** යනුවෙන් සඳහන් කළ යුතුය. ආදර්ශ අයදුම්පත් **www.psc.cp.gov.lk** වෙබ් අඩවියෙන් ලබාගත හැක.

(i) ආදර්ශ ආකෘති පත්‍රයට හා බඳවා ගැනීමේ නිවේදනයට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
(ii) ඉල්ලුම්පත් හෝ ඒ සම්බන්ධ ලිපි, තැපෑලේදී නැතිවූ හෝ ප්‍රමාද වූ හෝ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.
(iii) දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් විසින් සිය අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් ඔහුගේ නිර්දේශය සමග එවිය යුතුය.

**02. වැටුප් ක්‍රමය :**

රු: 22935-10x645-8x790-17x1050-53555/=
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව SL 1- 2006 වැටුප් කාණ්ඩය වේ.)

**03. සුදුසුකම්.:** (අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම මෙම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය)

අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

පළපුරුද්ද:
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**04. පොදු සුදුසුකම් :-**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක අඛණ්ඩ ස්ථිර පදිංචියක් මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ තිබිය යුතුය.
iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 25 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

අනුමත පරිපාටියේ විධිවිධාන වලට යටත්ව, සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර, එහිදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ඉහළම සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතුරින් අනුපිළිවෙල මත බඳවා ගනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමටද මෙහි විධිවිධාන සළසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමටද බලය මෙම කොමිෂන් සභාව සතුවේ.

**06. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති සහ කොන්දේසි :-**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
ii. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්තිවල විධිවිධාන අදාළ වන අතර, ආයතන සංග්‍රහයට වරින් වර කරනු ලබන සංශෝධන, මුදල් රෙගුලාසි රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

ඩබ්.එම්.කේ.කේ.කරුණාරත්න,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2013 නොවැම්බර් මස 19 වැනි දින
තැ.පෙ. 114, කටුගස්තොට පාර, මහනුවර.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**( A 4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත යුතුය.)**

**මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ නීති නිලධාරී III වන පන්තියේ තනතුරට බඳවා ගැනීම-2013**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) [ ]

01 (i) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................

(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- ..........................................

02. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..........................................

(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :- ..........................................

03. (i) උපන්දිනය :- වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

(ii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස : අවු: [ ] මාස: [ ] දින [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය: [ | | | | | | | | | ]

05. ස්ත්‍රී/පුරුෂ බව :- ............

06. විවාහක/අවිවාහක බව :- ...........

07. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද? :- ................

08. දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිරත අයෙකු නම් දරන තනතුර පිළිබඳ විස්තර

(i) තනතුර :- ..........................................

(ii) ස්ථිරද? තාවකාලිකද? :- ..........................................

(iii) විශ්‍රාම වැටුප් සහිතද?/රහිතද? :- ..........................................

(iv) තනතුරේ ස්ථිර කර තිබේද? :- ..........................................

(v) දැනට සේවය කරන ස්ථානය :- ..........................................

(vi) මාසික වැටුප :- ..........................................

09. **අධ්‍යාපන සුදුසුකම් :-**

| සමත් වූ උපාධිය හෝ විභාගය | උපාධිය හෝ විභාගය වලංගු වන දිනය | විෂයයන් | සාමාර්ථය | විශ්ව විද්‍යාලයේ හෝ ආයතනයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. වෙනත් අතිරේක සුදුසුකම් :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

11. නීති ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති පලපුරුද්ද පිලිබඳ විස්තර :- . . . . . . . . . . . . . . . . . . . . . . .

12. අයදුම්කරු කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
ඔව් නම් විස්තර දක්වන්න :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

13. අයදුම්කරු රජයේ සේවයෙන් පහකරනු ලැබ ඇත්ද? . . . . . . . . . . . . .
ඔව් නම් විස්තර දක්වන්න :- . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

14. මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සඳහන් කර ඇති සියලුම කරුණු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි. තෝරා ගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් පහ කරනු ලැබිය හැකි බවත් පැහැදිලිව දනිමි.

. . . . . . . . . . . . . . . . . . .

දිනය : . . . . . . . . . . . . . . . අයදුම්කරුගේ අත්සන

15. **<u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය . . . . . . . . . . . . . . දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

. . . . . . . . . . . . . . . . . .
සහතික කරන්නාගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

සහතික කරන අයගේ නම :- . . . . . . . . . . . . . . .
තනතුර/තත්ත්වය :- . . . . . . . . . . . . . . .
දිනය :- . . . . . . . . . . . . . . .

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු: 230700/- ට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පලාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

16 **<u>රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>**

(i) මෙම අයදුම්පත ඉදිරිපත් කරන . . . . . . . . . . . . . . . . . . . . . . මයා/මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ . . . . . . . . . . . . . . . . වශයෙන් සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවද, සේවා කාලය තුළදී අවවාද කිරීම් හැර කිසිම විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බවද, ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව පරිදි පත්වීම් ලිපියේ අංකය . . . . . . . . . . . . . බවද, ඔහු/ඇය ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදිදැයි පරීක්ෂා කර බැලූ බවද, ඒවා නිවැරදි බවද සහතික කරමි.

(ii) ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කල හැකිය/නොහැකිය

. . . . . . . . . . . . . . . . . . . .
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා
(නිල මුද්‍රාව තබන්න)

දිනය :- . . . . . . . . . . . . . . .
නම :- . . . . . . . . . . . . . . .
තනතුර :- . . . . . . . . . . . . . . .
ස්ථානය :- . . . . . . . . . . . . . . .